# ස්වාභාවික පරිසරය ආශ්‍රිත ද්‍රව්‍ය ඇසුරින් රංග ආභරණ නිර්මාණය කිරීම

නාට්‍යයක ආහාර්ය අභිනයට අයත් ආභරණ රංග ආභරණ නම් වේ. නාට්‍යයක දී යොදා ගනු ලබන රංග ආභරණ සැබෑ ජීවිතයේ දී අප පළදිනු ලබන රංග ආභරණ වලට වඩා සුවිශේෂී වේ. වේදිකාවක දී භාවිත කරන රංග ආභරණ ප්‍රේක්ෂකයාට හොඳින් දර්ශනය වන සේ සාමාන්‍ය ප්‍රමාණයට වඩා මදක් විශාලව සකස් කළ යුතුය.

වළලු මාල මුදු කරාබු ඔටුණු

අපිම සාදා පළඳා අපි රගමු





රංග භාණ්ඩ සෑදීමේ දී වැඩි මුදලක් වැය නොකර දේශීය අමුද්‍රව්‍ය යොදා සකසා ගත හැකිය.



- කිරිදි
- ඔළිද
- සියඹලා
- රබර්
- පුස් ඇට
- මදටිය
- දොඹ

මඤ්ඤොක්කා බඩ

නූල්

ඉදිකටු

කම්බි

ගම් වර්ග







මෙසේ අප රංගාභරණ නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු බොහෝ ඇත.

- ප්‍රමාණයෙන් විශාල විය යුතුය.
- කල් පැවැත්ම
- පහසුවෙන් පැළඳීම හා ගැලවීමට හැකි විය යුතුය.
- වර්ණවත් විය යුතුය.
- නාට්‍ය ශෛලියට ගැලපිය යුතුය.
- අනෙකුත් ඇඳුම් පැළඳුම් ආදිය සමග ගැලපිය යුතුය.

ඉහත කරුණු අවබෝධ කරගෙන ඔබට රංගාභරණ නිර්මාණය කළ හැක.



වී වර්ග ඉපිල් ඇට සහ මදටිය යොදා තැනූ අරුංගල් යුවලක් හා කර මාලයක්



සුදු කිරිඳි සහ මදටිය යොදා තැනූ කර මාලයක්



ස්වාභාවික පරිසරයේ හමුවන කල් තබා ගත හැකි ද්‍රව්‍ය භාවිතයෙන් අලංකාර ආභරණ නිර්මාණය කරගත හැකිය. එහි දී ඔබේ නිර්දාණශීලීත්වය වඩා වැදගත් වේ.එමගින් රංගාභරණ නිර්මාණය සඳහා අධික වියදමක් දැරීමට ද සිදු නොවේ.

**පැවරුම : ඔබ අවටින් සපයා ගත හැකි අමුද්‍රව්‍ය උපයෝගී කරගෙන රංගාභරණ නිර්මාණය කරන්න.**